**ශීර්ෂය 291 - වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 291-වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 13 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 2,114.60 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,598.40 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 516.20 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 24.41 ක් වී තිබුණි.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 203.80 | 197.34 | 6.46 | 3.17 |
| මූලධන | 1,910.80 | 1,401.06 | 509.74 | 26.68 |
| **එකතුව** | **2,114.60** | **1,598.40** | **516.20** | **24.41** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 29101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 10.88 | 10.21 | 8.38 | 10.01 | 50.00 | 34.42 |

## 2.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0091/0015/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 1.84 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 04 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 24.26 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0024/000 | 7.26 |
| 6000/0000/00/0016/0057/000 | 13.73 |
| 6000/0000/00/0002/0110/000 | 2.27 |
| 6000/0000/00/0013/0092/000 | 1.00 |
| **එකතුව** | **24.26** |

## 2.5 විගණන නිරීක්ෂණය

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (ඈ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 |
| (ඉ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) |
| (ඊ) | විදුලි සවිකිරීම් ලේඛනය | මුදල් රෙගුලාසි 751(2) |
| (උ) | රාජකාරි දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) |
| (ඌ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (එ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647 |

### 3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

විෂය අංක 29101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ණය ශේෂවල එකතුව රු.1,106,630 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 04 ක සිට වර්ෂ 18 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ණය ලෙජරයේ කේවල ණය ශේෂය 2015 ජනවාරි 01 දිනට ණය ලෙජරයේ ඉදිරියට ගෙන එන ශේෂය අතර වෙනස රු.1,417 ක් වී තිබුණි..

(ඇ) ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දෙදනෙකුගේ එකතුව රු.150,933 ක් වූ ණය, ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂයේ ඇතුළත් කර නොතිබුණ අතර ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් දෙදනෙකුගේ එකතුව රු.15,000 ක් වූ ණය ශේෂ, ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ යටතේ දක්වා නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවේ නිලධාරියකු 2011 සැප්තැම්බර් 21 දින සිට ඔක්තෝබර් 17 දින දක්වා වැටුප් රහිත නිවාඩු ලබා සිටි අතර 2014 සැප්තැම්බර් 26 සිට 2015 පෙබරවාරි 04 දක්වා සේවයට වාර්තා කර නොතිබුණි. මෙම සේවයට වාර්තා නොකළ කාලයද කිසිම පදනමක් නොමැතිව වැටුප් රහිත නිවාඩු ලෙස සලකා සේවයේ පිහිට වූ එම නිලධාරියාට විනයානුකූලව කටයුතු කිරීමක්ද කර නොතිබුණි. ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3.21 අනුව ණය මුදල් ආපසු ගෙවීමට කටයුතු නොකරන නිලධාරියකුට තවත් ණය මුදලක් ලබා ගැනීමේ අයිතිය අහිමි වුවත්, ඒ පිළිබඳව නොසලකා 2015 ජුනි 22 දින රු.105,586 ක් වූ ආපදා ණය මුදලක්ද එම නිලධාරියාට ගෙවා තිබුණි.

## 3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

කොළඹ වරාය නගර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා "අතිරේක පාරිසරික බලපෑම් ඇගැයීමේ වාර්තාව" සැකසීම දෙපාර්තමේන්තුව විසින් සිදු කර සමාලෝචිත වර්ෂයේදී රු.208,331 ක් වැය කර තිබුණි. එසේ වුවද එම කාර්යයන් ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම<br>රු. | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|---|
| (i) | ලැප්ටොප් පරිගණක | 02 | 212,000 | මාස 10 |
| (ii) | කෝණ මිනුම් උපකරණය 1600 | 01 | G.T.Z. ව්‍යාපෘතියෙන් ලැබී ඇත | වර්ෂ 10 මාස 08 |
| (iii) | කෝණ මිනුම් උපකරණය 212 | 01 | 163,000 | වර්ෂ 02 මාස 03 |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව 2016 සැප්තැම්බර් 13 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

(ii) 2014 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 760 හා 767 පරිදි කටයුතු කර නොතිබුණි.

**(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

දෙපාර්තමේන්තුවේ මීගමුව ප්‍රාදේශීය කාර්යාලයට ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු7,800,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ගොඩනැගිල්ල ඉදිකිරීමට වෙන්කර තිබුණු ඉඩමේ අයිතිය දෙපාර්තමේන්තුව විසින් තහවුරු කර ගෙන නොතිබියදීත්, එම ගොඩනැගිල්ලේ සැලැස්ම හා පස් පරීක්ෂාව සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.2,183,087 ක් වැය කර තිබුණි.

**3.5 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| (i) 1988 අංක 64 හා 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ සංශෝධන පනත් මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත | | |
| ▪ 9(2), 12(1), 12(11) හා 12(5) වගන්ති | -- | අධ්‍යක්ෂ ජනරාල් විසින් වෙරළ කලාප ඇතුළත සියලු සම්පත් හා කටයුතු පිළිබඳ කරනු ලබන සමීක්ෂණයේ ප්‍රතිඵල පදනම් |

| | | |
|---|---|---|
| | | කරගත් වෙරළ කළාපය සහ වෙරළ සම්පත් කළමනාකරණය කිරීමේ සැලැස්මක් පිළියෙල කළ යුතුව තිබුණි. එමෙන්ම එය ක්‍රියාත්මක වන දිනයේ සිට වර්ෂ 05 ක කාලය තුළ සහ සැලැස්මේ සෑම ප්‍රතිශෝධනයකම සිදු කළ දින සිට වර්ෂ 05 ක කාලය තුළ සැලැස්ම ප්‍රතිශෝධනය කළ යුතුව තිබුණි. දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දින වන විටත් 1997 වර්ෂයේදී පිළියෙල කරන ලද වෙරළ කලාපය සහ වෙරළ සම්පත් කළමනාකරණය කිරීමේ සැලැස්ම පමණක් ක්‍රියාත්මක කර තිබුණි. |
| ▪ 31 (1), (2) වගන්ති | -- | අනවසර ඉදිකිරීමක් නොකළ යුතු අතර එවැනි ඉදිකිරීමක් යම් කාලයක් ඇතුළත ඉවත් කළ යුතු වුවත්, 2012 වර්ෂයේ සිය 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ හඳුනාගන්නා ලද අනවසර ඉදිකිරීම් 896 කින් ඉදකිරීම් 55 ක් හෙවත් සියයට 6 ක් පමණක් කඩා ඉවත් කර තිබුණි. |
| ▪ 31(3)වගන්තිය | 2,197,500 | වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදලේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මෙම අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය රු.2,197,500 ක් වූ අතර අරමුදලට එකතු වන මුදල් හා වියදම් කරන මුදල් පිළිබඳ විධිමත් ගිණුම් තැබීමක් සිදුකළ බව විගණනයේදී තහවුරු වී නොතිබුණි. |
| ▪ 31(4)වගන්තිය | 12,232,446 | දෙපාර්තමේන්තුව විසින් 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී කඩා ඉවත්කිරීම් සඳහා දෙපාර්තමේන්තුව වැය කළ රු.12,232,446 ක් අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

------------------------------

| | | |
|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 104(1) | -- | 2015 වර්ෂයේ සිදු වූ වාහන අනතුරු 07 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 109 හා 113 | 35,355 | අලාභහානි ලෙස වාර්තා කර තිබුණු රු.35,355 ක් වූ අලාභ හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 747(1) | -- | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ අලුත්වැඩියාව නිසා ඉවත් කරනු ලැබූ කාර්යාලීය උපකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තු නිලධාරීන්ට 2015 මාර්තු 26 දින වෙන්දේසියේ විකුණා තිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 753(2) | -- | ගබඩාවට ලැබෙන සියළුම භාණ්ඩ සඳහා 219 වැනි පොදු ආකෘති පත්‍රයෙහි ලැබීම් ඇණවුම් නිකුත් කර නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 1645 | 96,000 | ප්‍රධාන ගණකාධිකාරි වෙත අනුයුක්ත කර තිබුණු වාහනය ගිණුම් අංශයේ රාජකාරි සඳහා භාවිතා කිරීම වෙනුවෙන් මාසිකව රු.8,000 බැගින් ඉන්ධන අත්තිකාරමක් ගෙවා තිබුණද, එය මාසික සාරාංශ වාර්තාවලින් සනාථ වී නොතිබුණි. |
| **(ඇ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| | 2007 සැප්තැම්බර් 11 දිනැති අංක 21/2007 චක්‍රලේඛය | -- | රටින් බැහැරවීම සඳහා ලබාගත යුතු අග්‍රාමාත්‍ය අවසරය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 09 දෙනෙකු ලබාගෙන නොතිබුණි. |
| **(ඇ)** | **රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ** | | |
| | 2004 ජනවාරි 05 දිනැති අංක ඊආර්ඩී/සීඅයිආර්/01/3 (I) චක්‍රලේඛයේ 9 ඡේදය | -- | සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ IFAD ව්‍යාපෘතිය යටතේ විදේශ පුහුණුව ලැබූ නිලධාරීන් 06 දෙනෙකු විසින් දෙපාර්තමේන්තුවට හා අදාළ විදේශ අනුග්‍රාහකයාට විදේශ පුහුණුව පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |

## 3.6 කාර්යසාධනය

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

මාරවිල- තල්විල වෙරළ තීරය 2013 වර්ෂයේදී ගැඹුරු මුහුදේ සිට වැලි පොම්ප කිරීමෙන් කෘත්‍රිම වෙරළක් සකස් කර තිබුණි. නැවතත් එම ප්‍රදේශය උග්‍ර ඛාදනයට ලක්වීම හේතුවෙන් 2015 වර්ෂයේදීද දෙවන අදියර යටතේ මුහුදේ සිට වැලි පොම්ප කිරීමෙන් කෘත්‍රිම වෙරළක් සකස් කිරීමේ කාර්ය ක්‍රියාත්මක කර තිබුණි. 2015 සැප්තැම්බර් 18 දින ඉදිරිපත් කළ අංක 12/2015 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2015 ඔක්තෝබර් 25 දිනැති අංක පීඑෆ්ඩී/ඒඑස්ඩී/සීඑම්/326 දරන මුදල් අමාත්‍යවරයාගේ ලිපියට අනුව පහත සඳහන් කාර්යයන් ඉටු කළ යුතුව තිබුණි.

(i) වැලි නැවත මුහුදට ගසාගෙන යාමේ සම්භාවිතාවයක් පවතින බැවින් ඛාදනය වූ වෙරළට වැලි පෝෂණය කිරීම සඳහා තිරසාර විසඳුමක් අදාළ සියළු පාර්ශවයන් එක්ව ලබා දීම.

(ii) ඒ සඳහා සුදුසු නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මඟින් තාක්ෂණික වාර්තාවක් අමාත්‍ය මණ්ඩලයේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කිරීම.

මේ සඳහා පත් කරන ලද නිලධාරීන් 08 දෙනෙකුගෙන් යුක්ත වූ කමිටුවේ වාර්තාව 2015 දෙසැම්බර් 31 දින වන විට මාස 07 ක් ගත වී තිබුණත්, එය ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) ව්‍යාපෘති ඉටුනොකිරීම**

පහත සඳහන් ව්‍යාපෘති සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් එකතුව රු.107,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. නමුත් එම ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී කිසිඳු වියදමක් කර නොතිබුණි. මේ නිසා සැලසුම් කර තිබූ පරිදි එම ව්‍යාපෘති ආරම්භ කරද නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත මුදල |
|---|---|
| | රු. |
| මුතුපන්තිය/නගුලෙලිය ග්‍රොයිනය | 15,000,000 |
| දූන්ගල්පිටිය රජවේල ග්‍රොයිනය | 30,000,000 |
| කහව ග්‍රොයිනය | 30,000,000 |
| තෙල්වත්ත ග්‍රොයිනය | 30,000.000 |
| කොග්ගල කලපුව | 2,000,000 |
| **එකතුව** | **107,000,000** |

**(ඇ) ක්‍රියාකාරී සැලැස්මට අනුව භෞතික ප්‍රගතිය ප්‍රමාණවත් නොවීම**

2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබූ පහත ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සියයට 5ක සිට සියයට 47 ක් දක්වා පරාසක ප්‍රමාණයක අඩු මට්ටමක පැවැතුණි.

| ක්‍රියාකාරකම | ඉලක්කගත | | භෞතික ප්‍රගතිය | |
| --- | --- | --- | --- | --- |
| | මූල්‍ය | ප්‍රතිශතය | මූල්‍ය | ප්‍රතිශතය |
| | රු. | | රු. | |
| ගොඩනැගිලි | 7,800,000 | 100 | 2,183,000 | 30 |
| වෙරළ සමීක්ෂණ හා වෙරළ තීර සංවර්ධනය | 8,500,000 | 100 | 3,373,000 | 47 |
| පයාගල දියකඩනය | 45,000,000 | 100 | 22,378,000 | 40 |
| වැලිගම වෙරළ උද්‍යානය | 25,000,000 | 100 | 13,800,000 | 5 |
| මාරවිල දියකඩන ප්‍රතිෂ්ඨාපනය | 8,000,000 | 100 | 1,008,000 | 5 |
| අකුරල ගල් බැම්ම | 20,000,000 | 100 | 15,606,000 | 40 |
| බණ්ඩාරමුල්ලමංතීරු හා රිවට්මන්ට් | 10,000,000 | 100 | 1,066,000 | 40 |

**3.7 පාඩු හා හානි**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) උණවටුන වැලි පෝෂණ ව්‍යාපෘතිය සඳහා දෙපාර්තමේන්තුව සහ කොන්ත්‍රාත්කරු අතර 2014 දෙසැම්බර් 04 දින ඇති කරගත් ගිවිසුම අනුව යුරෝ 5,187,000 කට වැලි ඝන මීටර් 200,000 ක් පොම්ප කිරීමට එකඟ වී තිබුණි. වැඩ අවසන් බවට නිකුත් කළ දින රහිත ඉංජිනේරු සහතිකය අනුව ගිවිසුම පරිදි කාර්යය නිම කර ඇති බව සහතික කර තිබුණි. 2015 මැයි 11 දිනැති කොන්ත්‍රාත්කරුගේ ලිපියට අනුව ඉංජිනේරු සහතිකයේ දක්වා ඇති වැලි ප්‍රමාණය ගණනය කිරීම වැරදි බවත් සැපයූ වැලි ප්‍රමාණය ඝන මීටර් 214,070 ක් බවත් දන්වා තිබුණි. දෙපාර්තමේන්තුව හා කොන්ත්‍රාත්කරු සමඟ සාමූහික මිනුම් ලබා නොගෙන කොන්ත්‍රාත්කරු පෙන්වා දුන් වැඩියෙන් සැපයූ වැලි ඝන මීටර් 14,070 නිවැරදි බවට පළමු සහතිකය ලබා දුන් ඉංජිනේරුවරු විසින්ම නැවත සහතික කර තිබුණ අතර ඒ අනුව කළ ගෙවීම නිසා දෙපාර්තමේන්තුවට සිදු වූ පාඩුව රු.20,099,135 ක් වී තිබුණි.

(ආ) 2013 වර්ෂයේදී රු.66,929,783 ක් වැය කර ඉදිකරන ලද මීටර් 200 ක් දිග උණවටුන දියකඩනය ඉදිකිරීමට ප්‍රථම කිසිදු ආකාරයක පාරිසරික බලපෑම් ඇගයීමක් හෝ විද්‍යාත්මක අධ්‍යනයක් සිදු නොකර දියකඩනය ඉදිකර තිබූ අතර එම ඉදිකිරීමෙන් පසු ඊට ආසන්න වෙරළෙහි ඇති වූ ඛාදන තත්ත්වයට පිළියමක් වශයෙන් එම දියකඩනයෙන් මීටර් 100 ක ප්‍රමාණයක් ගලවා ඉවත් කිරීමට ඒ සඳහා පත්කළ විශේෂ කමිටුවක් විසින් නිර්දේශ කර තිබුණි. දියකඩනය කැඩීම සඳහා පමණක් විද්‍යාත්මක අධ්‍යනයක් සිදු කර තිබුණ අතර එවැනි අධ්‍යනයක් එම ඉදිකිරීමට ප්‍රථම සිදු කළේ නම් මෙම දියකඩනය කැඩීම සඳහා 2016 මාර්තු 29 දින වන විට වැය කළ රු.37,376,842 ක් වූ මුදල දෙපාර්තමේන්තුවට ඉතිරි කර ගැනීමේ හැකියාව තිබුණි. මෙම දියකඩනයේ ගැලවූ කොටස ඉදිකිරීම, එම කොටස නැවත ගලවා

ඉවත් කිරීම හා ප්‍රමාද ගාස්තු අඩුවෙන් අය කිරීම නිසා දෙපාර්තමේන්තුවට රු.71,487,484 ක මූල්‍යමය අලාභයක් සිදු වී තිබුණි.

## 3.8 විසඳා නොතිබුණු විගණන ඡේද

--------------------------------

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| | විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|---|
| | වර්ෂය | ඡේද අංකය | |
| (i) | 2013 | 1.6 (අ) (i) | අනවසර ඉදිකිරීම් කඩා ඉවත්කිරීමේ නියෝග 326 ක් නිකුත් කිරිම සඳහා රු.5,991,496 ක් වැය කර තිබුණද, කිසිදු කඩා ඉවත්කිරීමක් සිදු කර නොතිබුණි. |
| (ii) | 2013 | 1.7(ආ) | ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදය නිසා අවලංගු කළ කොන්ත්‍රාත්කරුවන් අසාදු ලේඛනගත කර නොතිබුණි. |
| (iii) | 2013 | 1.10(ආ) | දෙපාර්තමේන්තුවට වත්කම් පවරා ගැනීමේදී නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම නිසා සිදු වී තිබුණු රු.4,092,264 ක් වූ පාඩුව සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (iv) | 2013 | 1.13(අ) | කැපුන්ගොඩ දියකඩනයේ අපේක්ෂිත අරමුණ ඉටු නොවන ආකාරයෙන් ඉදිකිරීම නිසා කොටසක් කඩා ඉවත් කිරීමෙන් දෙපාර්තමේන්තුවට සිදු වූ රු.25,781,265 ක අලාභය සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (v) | 2014 | 3.12 | කඩා ඉවත් කිරීමේ නියෝගය නිකුත් කිරීමෙන් අනතුරුව එම කාර්යය සඳහා අවසර පත්‍රයක් ලබා දීම හා ඒ සඳහාම නැවත වරක් නිකුත් කළ කඩා ඉවත් කිරීමේ නියෝගය අනුව සම්පූර්ණ ගොඩනැගිල්ල ඉවත් කළ යුතු වුවද, තට්ටු 04 කින් සමන්විත ගොඩනැඟිල්ලක මහල් 02 ක් පමණක් කඩා ඉවත් කර තිබුණි. |
| (vi) | 2014 | 3.14(ආ) | තාක්ෂණික ඇගයීම් වාර්තාව අනුව වැඩිම ලකුණු ලබා ගත් සමාගම නොසළකා දෙවැනි අවම මිල ගණන් ඉදිරිපත් කළ සමාගමට කොන්ත්‍රාත්තුව පිරිනැමීම නිසා දෙපාර්තමේන්තුවට සිදු වූ පාඩුව රු.89,831,536 ක් වී තිබුණි. |
| (vii) | 2014 | 3.14(ඇ) | දියකඩන ඉදිකිරීම් හා වැලි පෝෂණ කොන්ත්‍රාත් සඳහා කොන්ත්‍රාත්කරුවන් සමඟ එළඹ තිබුණු ගිවිසුම අනුව කාලයට අනුගතව වැඩ නොකිරීම මත රු.11,488,276 ක්වූ ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි. |

**3.9 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 38 | 25 | 13 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 01 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 331 | 237 | 94 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 174 | 112 | 62 |
| | **එකතුව** | **547** | **375** | **172** |